# ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනයෙහි ලා ස්වර්ණමය අවස්ථාවක් වන ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' වැඩපිළිවෙළ සහයෝගීව ක්‍රියාවට නැංවීම

*චීන තානාපති අතිගරු චෙං ක්ෂෙයුආන් මැතිඳුන් විසිනි*

2018 ජනවාරි මස දී මම කොළඹ දී ශ්‍රී ලංකාවේ 21 වැනි චීන තානාපතිවරයා වශයෙන් වැඩ බාරගතිමි. සෑම අංශයක ම හිතවතුන් සමග පුළුල් ලෙස සම්බන්ධ වෙමින් ශ්‍රී ලංකාව පිළිබඳවත් මෙරට හා සමග වූ ද්විපාර්ශ්වික සබඳතා පිළිබඳවත් මා තුළ වූ දැනුම පුළුල් කරගැනීමට මෙන් ම අනාගත චීන ශ්‍රී ලංකා යථාරූපී සහයෝගිතාව පිළිබඳව මගේ විශ්වාසය තහවුරු කරගැනීමට ද ඉකුත් දෙමස තුළ දී මට හැකි වී ය. සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් අප ගේ ශ්‍රී ලාංකීය මිත්‍රයන් වෙත චීන තානාපති සේවයෙහි හෘදයංගම ආසිංශනය පළ කරන අතර ම අප දෙරටත් අප ගේ රටවැසියනුත් වෙත වඩා යහපත් ප්‍රතිලාභ අත් වන පරිදි ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' වැඩ පිළිවෙළෙහි ආකෘතිය හා සම්බන්ධ මගේ ප්‍රායෝගික අදහස් ඔබ ඉදිරියේ ප්‍රකාශ කිරීමට ද මම මෙය අවස්ථාවක් කරගනිමි.

## i. ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' වැඩ පිළිවෙළ වනාහි ලෝක ආර්ථික දුෂ්කරතා සම්බන්ධයෙන් චීනයෙන් ලැබෙන පිළිතුරයි. එසේ ම එය මානුෂීය සහයෝගිතාව සහිත අනාගත ජනසමාජයක් නිර්මාණය කරවීම දෙසට යොමු වූ මාවත ද වන්නේ ය.

චීනය ප්‍රතිසංස්කරණය වෙමින් විවෘත භාවය කරා එළඹීමෙහි 40 වැනි සංවත්සරය වශයෙන් සැලකෙන්නේ 2018 වසරයි. පසුගිය අවුරුදු 40 තුළ දී චීනයෙහි දළ දේශීය නිෂ්පාදිතය (දදේනි), 10% ක සාමාන්‍ය වාර්ෂික වර්ධනයක් මෙන් ම ඩොලර් 200 කට අඩුවෙන් තුබුණු ඒක පුද්ගල දදේනි ඩොලර් 8800 ක් දක්වා වූ වර්ධනයක් ද සහිතව, ඩොලර් බිලියන 200 සිට ඩොලර් ට්‍රිලියන 12. 7 දක්වා ඉහළ නැංවිණ. සමෘද්ධිමත් ජනසමාජයක මට්ටමට පිවිසුණු බිලියන 1. 3 ක් වූ ජනතාව ලෝක දරිද්‍රතාව අවම කරවීමෙහි ලා 70% කට වැඩි දායකත්වයක් ලබා දුන් අතර ලෝක ආර්ථික වර්ධනයෙහි ලා ඔවුන් ගෙන් ලද දායකත්වය 30% ද ඉක්මවන්නේ ය.

''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' වැඩ පිළිවෙළෙහි 5 වැනි සංවත්සරය වශයෙන් සැලකෙන්නේ ද 2018 වසරයි. ජනාධිපති ක්ෂි ජින්පිං විසින් යෝජිත ආසියා, යුරෝපා හා අප්‍රිකා මහාද්වීපයන් මෙන් ම අතිවිශාල සාගර ගණනාවක් ද ආවරණය කැරෙන මෙම මහගු වැඩපිළිවෙළ තුළින් ලෝක ජනගහණයෙන් 60% කට වැඩි ප්‍රමාණයක් වෙත ප්‍රතිලාභ ගෙන දීමට අපේක්ෂිත ය. ඉකුත් අවුරුදු පහ තුළ දී සියයකට අධික වූ රටවල් මෙන් ම ජාත්‍යන්තර සංවිධාන ද ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' වැඩ පිළිවෙළෙහි ලා ක්‍රියාත්මකව

සහභාගි වී ඇති අතර ඒවා අතරින් 80 කට අධික ප්‍රමාණයක් චීනය සමග ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' සහයෝගිතා ගිවිසුමට ද අත්සන් තබා තිබේ. සහයෝගිතා ව්‍යාපෘතීන් ගණනාවක් මේ වන විට ද ආරම්භ වී ඇත. 2017 මැයි මස දී පැවැති ජාත්‍යන්තර සහයෝගිතාව සඳහා වූ ප්‍රථම ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' සම්මන්ත්‍රණය ශ්‍රී ලංකාව ද ඇතුළු රටවල් හා ජාත්‍යන්තර සංවිධාන 140 කට අධික සංඛ්‍යාවක සහභාගිත්වයෙන් පැවැත්විණි. ජාත්‍යන්තර ප්‍රජාව තුළ ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' වැඩ පිළිවෙළට පුළුල් පිළිගැනීමක් ලැබී තිබේ.

ප්‍රතිසංස්කරණය හා විවෘතභාවය ලැබීමත් ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' වැඩ පිළිවෙළත් යන දෙක ම චීන කොමියුනිස්ට් පක්ෂයේ අභිලාෂයන්ට අනුගත වෙමින් අඛණ්ඩව ඉදිරියට ගමන් කරන්නේ ය. චීන කොමියුනිස්ට් පක්ෂය වනාහි චීන ජනතාව ගේ යහපත උදෙසා ක්‍රියාත්මක වීමෙන් නොනැවතී සමස්ත මානව සංහතියේ ම අභිවෘද්ධිය වෙනුවෙන් අරගලයක යෙදෙන දේශපාලන පක්ෂයකි. පක්ෂ ව්‍යවස්ථාවෙහි ඒ බැව් සඳහන්ව තිබේ.

එක් අතෙකින් චීන ජාතික ප්‍රබෝධනය පිළිබඳ සිහිනය සැබෑ කරවීමෙහි ලා ප්‍රතිසංස්කරණය හා විවෘතභාවය පුළුල් කරවීම සඳහා චීන කොමියුනිස්ට් පක්ෂය අවිච්ඡින්නව ක්‍රියාත්මක වී ඇති අතර ක්ෂි ජින්පිං සමාජවාදී චින්තනයේ මගපෙන්වීම යටතේ චීන ආවේණිකත්වයන්ට අනුව නව යුගයක් කරා රට මෙහෙයවීමට ද උත්සුක වී ය. එසේ ම '' මෙම සියවසේ ඉලක්කයන් දෙකක් '' සපුරාගැනීම පිණිස ද වෙර දරා තිබේ. චීන කොමියුනිස්ට් පක්ෂයට සියවස සපිරෙන 2021 වසරේ දී සෑම අංශයක ම සාමාන්‍ය සමෘද්ධිමත්භාවයක් සහිත සමාජයක් නිර්මාණය කරවීම ද චීන මහජන ජනරජයට සියවසක් සපිරෙන 2049 දී සමෘද්ධිමත් වූ ද ශක්තිමත් වූ ද ප්‍රජාතන්ත්‍රවාදී වූ ද උසස් සංස්කෘතියක් සහිත වූ ද සමගි සම්පන්න වූ ද අලංකාර වූ ද විශිෂ්ට නව සමාජවාදී රටක් බවට චීනය පත් කරවීම ද යනු එකී ඉලක්කයන් දෙකයි.

අනෙක් අතින් ස්වකීය සංවර්ධනය සාක්ෂාත් කරගනිමින් ම ලෝක සාමය හා පොදු සංවර්ධනය සඳහා උර දීම පිළිබඳව වූ උදාර මෙහෙවර ද චීන රජය සහ චීන කොමියුනිස්ට් පක්ෂය විසින් පැහැර හරිනු ලැබ නැත. අන්‍යොන්‍ය ගෞරවය ද යුක්ති සහගත බව ද සාධාරණත්වය ද හැමට සෙත ද සැලසෙන නව මුහුණුවරක ජාත්‍යන්තර සබඳතා නිර්මාණය කරගනිමින් සාමකාමී සංවර්ධන මාවතෙහි චීනය දිරිමත්ව ඉදිරියට ගමන් කරන බවත් ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' වැඩ පිළිවෙළෙහි අරමුණ වූ මිනිස් සමානාත්මතා සහිත අනාගත සමාජයක් ගොඩනැංවීම සඳහා චීනය උත්සුක වන බවත් ජනාධිපති ක්ෂි ජින්පිං සනාථ කෙළේ ය. එයින් විද්‍යමාන වන්නේ බලයේ සිටින පක්ෂයේ සහ රජයේ අධිෂ්ඨානය සහ වගකීමයි.

චීනයේ සංවර්ධනය ලෝකයෙන් වෙන් කොට දැකිය හැකි නොවන්නා සේ ම ලෝක සංවර්ධනයට චීනය ද අවශ්‍ය වන්නේ ය. අද්‍යතන ලෝකය ආර්ථික සංවර්ධනය පිණිස වූ අභිප්‍රේරණයෙන් තොර ය. ඇතැම් අංශ අවුල් වියවුලින් ගහණ ය. කලාපීය සංවර්ධනයෙහි සමතුලිතතාවක් දක්නට නැත. ඒකපාර්ශ්වීයත්වය පිළිබඳ භීතියත් ගෝලීයනය විරෝධයත් කුළුගැන්වෙන සේ ඇතැම් ලෝක සහ කලාපීය බලවත්තු ස්වකීය

යහපත තකා තම රටවල ගැටලු වෙනත් කුඩා රටවල් වෙතට තල්ලු කරති. සාමය ද සංවර්ධනය ද සහයෝගිතාව ද හැමට සෙත ද සලසමින් ලොව සැම රටකට ම පාහේ සියලු අංශයන් ගෙන් සමන්විත සංවර්ධනයක් සඳහා වූ වේදිකාවක් සපයමින් ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන්නේ 21 වැනි සියවසෙහි ප්‍රවණතාවනට අනුකූලව ය.

## ii. ශ්‍රී ලංකාවෙහි ජාතික සංවර්ධන ක්‍රමවේදය සඳහා ''බෙල්ට් ඇන්ඩ් රෝඩ්'' වැඩ පිළිවෙළ අතිශයින් ගැලපෙන්නේ ය.

ඈත අතීතයේ පටන් ම ශ්‍රී ලංකාව සමුදුරු සේද මාවතෙහි වැදගත් නැවතුමක් වූයේ ය. චීනය හා ශ්‍රී ලංකාව අතර වූ මිත්‍ර සම්බන්ධතාවනට හැම විට ම පදනම් වී තුබුණේ අන්‍යොන්‍ය ගෞරවය සහ සහයෝගයයි. වසර 1600 කට පමණ පෙර ෆා ක්සියන් හිමි බුදුදහම, සාමය හා මිත්‍රත්වය පහදා දීම පිණිස ශ්‍රී ලංකාවෙහි සිට චීනයට පැමිණියේ මෙකී සමුදුරු සේද මාවත ඔස්සේ ය. වසර 600 කට පමණ ඉහත දී ෂෙං හි ෆ්ලීට් පස් වරක් ම ශ්‍රී ලංකාව වෙත පැමිණෙමින් ද්විපාර්ශ්වීය ආර්ථික හා සාංස්කෘතික සබඳතාවන් පෙර නොවූ මට්ටමකට ඔසොවා තැබුවේ ය. වසර 60 කට පමණ ඉහත දී අධිරාජ්‍යවාදී බාධක මැඬ ඉදිරියට ගිය මෙම දෙරට යළිත් වරක් සාගරය හරහා සම්බන්ධ වෙමින් සුප්‍රකට රබර් සහල් ගිවිසුමට එළැඹුණහ. මෑත කාලයේ දී ත්‍රස්තවාදයට එරෙහි සටනෙහිදීත් ජාතික නිදහස, ස්වාධිපත්‍යය හා භෞමික අඛණ්ඩතාව සුරැකීමෙහිදීත් චීනය හා ශ්‍රී ලංකාව ක්‍රියාත්මක වූයේ අන්‍යොන්‍ය සහයෝගිතාවකින් යුතුව ය.

දශක තුනක සිවිල් යුද්ධය හේතු කොටගෙන මෙරට ජාතික ආර්ථික හා සමාජ සංවර්ධනයට දැඩි බාධා එල්ල වීම අභාග්‍යයකි. අවසානයේ 2009 වසරෙහි දී යුද්ධය කෙළවර වීමෙන් පසුව යුද නටඹුන් මතින් සංවර්ධනය කරා යාමේ දුෂ්කර අවස්ථාවට මුහුණ දුන් ශ්‍රී ලංකාවට ස්වකීය යටිතල පහසුකම් ගොඩනංවාගැනීමත් මූල්‍යමය ආයෝජනයනුත් සඳහා ජාත්‍යන්තර ප්‍රජාව ගේ සහයෝගය දැඩි සේ අවශ්‍ය වූයේ ය. එසේ වුව ද ජාත්‍යන්තර ආර්ථික අර්බුදය මෙන් ම ඇතැම් මතවාදමය හේතූන් ද මත අපේක්ෂිත විදේශීය සහයෝගය ශ්‍රී ලංකාවට ලැබුණේ නැත. මෙම තීරණාත්මක මොහොතෙහි දී සැම අංශයක ම ප්‍රතිසංස්කරණයන් සඳහා නැවතත් දෑත දිගු කරමින් සහයෝගය ලබා දුන්නේ චීනයයි. ස්වකීය ජාතික සංවර්ධන ක්‍රමවේදය හා මැනවින් ගැලපෙන්නා වූ ''බෙල්ට් ඇන්ඩ් රෝඩ් වැඩපිළිවෙළ'' (BRI) වෙත විවෘතව සහයෝගය ලබා දෙන මුල් ම රටක් බවට ශ්‍රී ලංකාව පත් වූයේ ඒ අනුව ය.

ශ්‍රී ලංකාවෙහි විශිෂ්ට භූගොලීය පිහිටීමෙහි වාසිය ලබාගෙන එය ඉන්දීය සාගරයේ කේන්ද්‍රස්ථානය බවට පත් කරගනිමින් සිය සහභාගිත්වය ද සහිතව BRI ක්‍රියාවට නැංවීම පිණිස ජනාධිපති සිරිසේනත් අගමැති වික්‍රමසිංහත් ඇතුළු වෙනත් දේශපාලන නායකයන් එකඟතාව පළ කිරීම පිළිබඳව මම බෙහෙවින් සතුටට පත් වන්නෙමි. සිය ආර්ථිකය මෙන් ම මෙරට ජනතාව ගේ ජීවනෝපාය ද ඉහළ මට්ටමකට ගෙන ඒමෙහි ලා BRI ස්වර්ණමය අවස්ථාවක් වන බව වඩ වඩා ශ්‍රී ලාංකික මිත්‍රයෝ දැන් අවබෝධ කරගනිති.

BRI ශ්‍රී ලංකාව තුළ බද්ධව ක්‍රියාත්මක කරවීමෙහි ලා පසුගිය වසර පහ ඇතුළත දී දෙරට විසින් විශාල ප්‍රගතියක් පෙන්වා තිබේ. මෙරට විදුලිබල සැපයුමෙන් 40% ක් නොරොච්චෝලෙයි විදුලි බලාගාරය (නැතහොත් පුත්තලම් විදුලි බලාගාරය ) වෙතින් ලබා දෙමින් නිතර නිතර විදුලිය කප්පාදුවට භාජන වූ කාල පරිච්ඡේදය අවසන් කරන ලදී. විදේශීය සංචාරකයනට අති විශාල පහසුවක් උදා කර දුන් කටුනායක අධිවේගී මාර්ගය ( කොළඹ ගුවන් තොටුපොළ අධිවේගී මාර්ගය ) සංචාරක ව්‍යාපාරයේ ප්‍රගමනයට විශාල දායකත්වයක් ලබා දී තිබේ.

චීන ශ්‍රී ලංකා බද්ධ ව්‍යාපෘතියක් වන කොළඹ ජාත්‍යන්තර බහලුම් රැඳවුම ලොව ශීඝ්‍රයෙන් වර්ධනය වන බහලුම් රැඳවුමකි. ශ්‍රී ලංකාවෙහි විශාලතම ජලාශය වූ අලුතෙන් නිම කරන ලද මොරගහකන්ද ව්‍යාපෘතිය දේශීය කෘෂිකර්මාන්තයට හා ජනතාවට ලබා දෙන ප්‍රතිලාභ සුවිශාල ය. ඉකුත් වසර 100 ඇතුළත ඉදි කැරෙන ප්‍රථම දුම්රිය මාර්ගය වූ දක්ෂිණ දුම්රිය මාර්ගය මෙම වසරෙහි ඔක්තෝබර් මාසයෙහි දී නිල වශයෙන් විවෘත වීමට නියමිත ය. ඉදිරි වසර අවසාන වන විට කොළඹ සහ හම්බන්තොට යා කැරෙන අධවේගී මාර්ගය ද නිම වනු ඇත. එක්සත් ජනපද ඩොලර් බිලියන 15 ක් ඉක්මවන ගමනාගමන, ජලය, විදුලිය, වරාය සහ තවත් ක්ෂේත්‍රයන් හි යටිතල ව්‍යාපෘතීන් නිම කරමින් 2017 අවසානය වන විට මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අති විශාල දායකත්වයක් චීන සමාගම් විසින් ලබා දී තිබිණි.

මෙයට අමතරව අප ගේ සහයෝගිතාව මගින් ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් රැකියාවන් 100,000 කට අධික ප්‍රමාණයක් නිර්මාණය කර දෙනු ලැබූ අතර තාක්ෂණ හා කළමනාකරණ සේවා නිරතියන් දස දහස් ගණනක් වෙත පුහුණුව ලබා දීමට ද පියවර ගෙන තිබේ.

උදාහරණයක් ලෙස CICT ගනිමු. දේශීය තාක්ෂණ සේවා නිරතියන් 1000 කට අධික ප්‍රමාණයක් එහි සේවයට යොදවනු ලැබ තිබෙන අතර ඔවුහු එහි සමස්ත කාර්ය මණ්ඩලයෙන් 90% ක් සපුරති. එසේ ලබා දෙන සහයෝගය මගින් ශ්‍රී ලංකාවෙහි සංවර්ධනය තව දුර ඉදිරියට ගෙන යාම පිණිස සකසනු ලබන්නේ ශක්තිමත් පදනමකි.

## iii. කොළඹ වරාය නගරයත් හම්බන්තොට වරාය සහ කර්මාන්ත කලාපයත් විසින් ශ්‍රී ලංකාවෙහි සංවර්ධනය වේගවත් කැරෙනු ඇත.

අදෘෂ්‍යමාන ශක්ති සමුදායක් චීනය හා ශ්‍රී ලංකාව සතුව පවතී. මෙම දෙරට අතර තිබිය යුතු සහයෝගිතාවෙහි විභවතාවන් මෙතෙක් සාක්ෂාත් කරගනු ලැබ නැත. ශ්‍රී ලංකාව පිහිටා තිබෙන්නේ ඉන්දීය සාගරයේ ප්‍රධාන මුහුදු මාර්ගයෙහි හරි මැද ය. මේ වූකලී ශ්‍රී ලංකාවෙහි සංවර්ධනය සඳහා වන ලොකු ම වාසියයි. එබැවින් විශේෂයෙන් ම කොළඹ සහ හම්බන්තොට යන වරායයන් සුවිශේෂී සැලකිල්ලට භාජන විය යුතු විෂයයන් බවට පත් වනු ඇත. කොළඹ වරාය නගරයත් හම්බන්තොට වරාය සහ කර්මාන්ත කලාපයත් මට පෙනෙන්නේ ශ්‍රී ලංකා ආර්ථිකය ඉහළට ඔසොවන ප්‍රබල යන්ත්‍ර දෙකක් ලෙසය.

මෙම සුවිශාල ව්‍යාපෘතීන් හි අඛණ්ඩ වර්ධනයත් සමග චීන ශ්‍රී ලංකා වෙළෙඳ සහයෝගිතාවෙහි නව පරිච්ඡේදයක ආරම්භය අපේක්ෂා කළ හැකි ය.

කොළඹ වරාය නගරය වනාහි, දකුණු ආසියාවෙහි නාවුක. ප්‍රසම්පාදන. සංචාරක සහ මූල්‍ය කේන්ද්‍රය බවට පත් කරගැනීමේ අපේක්ෂාවෙන් එජ ඩොලර් බිලියන 1 .4 ක ඍජු ආයෝජනයක් ද එජ ඩොලර් බිලියන 13 ක් යෙදවෙන ගොඩනැගිලි සංකීර්ණයක් සඳහා වූ දෙවැනි අදියර සැලසුමක් ද ඇතිව චීන සමාගමක් සහ ශ්‍රී ලංකාව බද්ධව ක්‍රියාත්මක කැරෙන ව්‍යාපෘතියකි. එමගින් 80,000 ක් ඉක්මවන රැකියා ප්‍රමාණයක් නිර්මාණය වනු ඇතැයි අපේක්ෂිත ය. මේ වන විට භූමිය පිරවීමේ කටයුතුවලින් 80%ක් නිම කරනු ලැබ ඇති අතර CIFC ගොඩනැගිලි සංකීර්ණය සඳහා වූ ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාවලිය ද සුමටව ඉදිරියට යමින් තිබේ. චීනය, එක්සත් ජනපදය සහ යුරෝපය ආදී රටවල ආයෝජකයන් විශාල ප්‍රමාණයක අවධානය වරාය නගරය ව්‍යාපෘතිය විසින් ආකර්ෂණය කරගනු ලැබ ඇත. ඉන්දියන් සාගර ජලයෙහි නීල වර්ණනේ ද බැසයන හිරු ගේ ලා රත් පැහැයෙන් ද අලංකෘත ඉදි වෙමින් පවතින වරාය නගරය කොළඹ ඇති වඩාත් ම නෙත්කලු දර්ශනය බවට දැන් පත් වී තිබේ.

ශ්‍රී ලංකාවෙහි දක්ෂිණ ප්‍රදේශයේ මහඟු ස්ථානයක පිහිටා ඇති හම්බන්තොට වරාය එහි සංවර්ධනය වෙනුවෙන් ඉටු කරන්නේ සුවිශේෂී කාර්යභාරයකි. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත හම්බන්තොට වරාය ඉදි කිරීමේ කාර්යයට චීනය අතගසා තිබෙන්නේ එයට රුකුල් දීම සඳහා ය. වරාය මෙහෙයවුම් කටයුතු සඳහා ඇතැම් විදේශීය රටවල සහාය ලබාගැනීමට රජය දැරූ ප්‍රයත්නයන් සාර්ථක නොවීම වරාය මෙහෙයවුම් කටයුතු කෙරෙහි විශාල ලෙස බලපෑවේ ය. මෙම ගැටලුවට විසඳුමක් වශයෙන් 2017 අවසානයේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියත් සමග අත්වැල් බැඳගැනීම සඳහා චීන සමාගම් වෙත ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් ආරාධනා ලැබිණ. 70% සහ 30% දායකත්ව ක්‍රමය තුළින් බද්ධව වරාය මෙහෙයවුම් කටයුතුවල නිරත වීමේ අවස්ථාව උදා වූයේ ඒ අනුව ය. සමස්ත ක්‍රියාවලිය මෙහෙයැවෙන්නේ ජාත්‍යන්තර නියමයන්, නීති සහ වෙළෙඳපොළ පරිචයනට අනුකූලව මුළුමනින් විවෘතව සාධාරණව සහ පාරදෘෂ්‍ය භාවයෙන් ද යුතුව ය. එතැන් සිට මාස තුනක් ගත වීමෙන් අනතුරුව දැන් සමස්ත වරාය ම නිරන්තර වෙනස්කම් විද්‍යමාන කරවමින් ශීඝ්‍රයෙන් සංවර්ධනය යෙමින් තිබේ. මෝටෝ රථ ප්‍රවාහන ව්‍යාපාරය සැලකිය යුතු මට්ටමක ප්‍රගතියක් අත් කරගෙන ඇත. නාවුක සැපයුම් ව්‍යාපාරය ද වේගයෙන් ඉදිරියට යන්නේ ය.

වරායෙහි සුවිශාල වාසි පිළිබඳ සම්පූර්ණ විමර්ශනයක යෙදිය හැකි වනු පිණිස කාර්මික අංගනයක් හම්බන්තොට පිහිටුවීමේ එකඟතාවකට ද දෙපාර්ශ්වය පිවිස ඇත. දේශීය ආර්ථිකය සහ ජනතා ජීවනෝපායයන් විෂයෙහි ප්‍රබල වෙනස්කම් ඇති කරවීමෙහි සමත් LNG විදුලි බලාගාර ද ඛනිජතෙල් පිරිපහදු ද සිමෙන්ති නිෂ්පාදන ද යකඩ සහ වානේ නිෂ්පාදන ද වැනි මහා පරිමාන ව්‍යාපෘතීන් පිළිබඳව වූ සාකච්ඡා කඩිනමින් සිදු වෙමින් පවතින හෙයින් එය ද ශ්‍රී ලංකා ආර්ථික වර්ධනය වේගවත් කරවන තවත් නව යන්ත්‍රයක් වශයෙන් සැලකිය හැකි ය.

## iiv.ශ්‍රී ලංකාව සමග සමීප සහයෝගිතාව මෙම නව යුගයේ දී චීනය අපේක්ෂා කරයි

BRI යනු විශ්ව මානව යහපත සඳහා වූ පාරදෘෂ්‍ය වැඩපිළිවෙළකි. ආරම්භයේ පටන් ම අදහස් මැනවින් විමසීමත් සාමූහික දායකත්වයත් අන්‍යොන්‍ය ප්‍රතිලාභත් පිළිබඳව වූ විශිෂ්ට නියමයන් අනුගමනය කරන මෙම වැඩපිළිවෙළ ජාත්‍යන්තර නියමයන්ට අනුකූල වන්නා සේ ම වෙළෙඳපොළ පිළිවෙත් ද අනුගමනය කරයි. රාජ්‍ය සභිකයකු මෙන් ම විදේශ අමාත්‍යවරයා ද වූ අතිගරු වැං යී මහතා සඳහන් කළ පරිදි BRI ව්‍යාපෘතීන් සැලසුම් කරන්නේත් සහ ක්‍රියාවට නංවන්නේත් ඊට සහභාගි වන පාර්ශ්වයන් අතර විවෘතව කැරෙන සාකච්ඡාවන් ගෙන් අනතුරුව ය. එම ක්‍රියාවලියෙහි දී කිසිදු රටක් සෙසු රටවල් අබිබවනය නොකරයි. සමානව අදහස් පළ කිරීමේ හැකියාව සෑම පාර්ශ්වයකට ම තිබේ. සැඟවී කැරෙන ගනුදෙනු එහි දී සිදු වන්නේ නැත. සියල්ල පාරදෘෂ්‍ය භාවයෙන් යුක්ත ය. ජයග්‍රාහකයාට සියල්ල හිමි වීමේ ක්‍රමයක් එහි නැත. සෑම ව්‍යාපෘතියකින් ම සැමට ම ප්‍රතිලාභ අත් වන්නේ ය.

BRI ප්‍රවර්ධනය කිරීමට නම් සීතල සටන් මානසිකත්වය සහ එක් පාර්ශ්වයක් බින්දුවට බස්වා ප්‍රතිලාභ ලැබීමේ පිළිවෙත දුරලිය යුතු ය. BRI සඳහා පුළුල් පිළිගැනීමක් ලැබීමේ සැබෑ හේතුව වන්නේ එය තුළ වූ පැහැදිලි සමානතාව ද විවෘත භාවය ද සාර්වත්‍ර භාවය ද වන්නේ ය. අවුරුදු දහසකට පමණ පෙර ලියැවුණු චීන කවියක් මෙහි ලා සඳහන් කිරීමට මම කැමැත්තෙමි. '' *පාවෙන වළාකුළු මගේ දෑස් නිලංකාර කරතැයි මම බිය නොවෙමි. මා සිටින්නේ ගොඩනැගිල්ලෙහි ඉහළ ම තට්ටුවේ නොවේ ද?*'' BRI ගමන් ගන්නේ නිවැරැදි මාවතෙහි වන හෙයින් ඒ පිළිබඳව නැඟෙන නෙත් අන්ධ කරවන හා අහේතුක විවේචනයන් අවසානයේ දී පා වෙන වළාකුළු සේ ම පහව යනු ඇති බවට විශ්වාසය අප තුළ තිබේ.

චීන ලක්ෂණ රැගත් සමාජවාදය නව යුගය වෙත ප්‍රවේශ වන විට චීන ප්‍රතිසංස්කරණයන් තව තවත් සූක්ෂමව සිදු වනු ඇති අතර විවෘත භාවය ද තවතවත් පුළුල් වනු ඇත. ඒ සමග ම BRI සහයෝගිතාව ද තවතවත් ශක්තිමත් වන්නේ ය. ලොව විශාලතම ජනගහණය සහිත දෙවැනි විශාලතම ආර්ථිකය වන චීනය දෙවැනි විශාලතම ආනයනකයා මෙන් ම පරිභෝජකයා ද වන හෙයින් ඉදිරි වර්ෂ පහ තුළ දී එජ ඩොලර් ට්‍රිලියන 10 කට අධික ආනයනයන් ක්‍රියාත්මක කිරීමටත් එජ ඩොලර් බිලියන 750 කට අධික මුදලක් විදේශයන් හි ආයෝජනය කිරීමටත් චීනය පෙළැඹෙනු ඇත. චීනයෙහි සංවර්ධනය වූකලී දීප්තිමත් අනාගතයක් මෙන් ම පැදිලි ගමනාන්තයක් ද සහිතව වේගයෙන් ධාවනය වන දුම්රියක් හා සමාන ය. ශ්‍රී ලංකාව ද ඇතුළු සෑම රටක් ම ඒ ගමනට එකතු කරගැනීම සඳහා චීන ජාතිකයෝ දෑත් විහිදුවාගෙන බලා සිටිති. අප දෙරට ජනතාව සඳහා අලංකාර හා දීප්තිමත් අනාගතයක් නිර්මාණය කරගැනීමෙහි ලා එකමුතුව කටයුතු කිරීම පිණිස BRI සාමූහිකව ක්‍රියාවට නංවමින් චීන ශ්‍රී ලංකා අපේක්ෂා සහිත ජනසමාජයක් දෙසට යොමු වූ ගමන සඳහා අතත්වැල් අල්ලාගැනීමට ශ්‍රී ලංකාවේ සෑම අංශයකට ම අපි ඉත සිතින් ආරාධනය කරමු.